වැවිලි අමාත්‍යාංශය

පොල්, කිතුල් හා තල් වගා ප්‍රවර්ධනය හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදන හා අපනයන විවිධාංගිකරණ රාජ්‍ය අමාත්‍යාංශය

# පොල් වගාකිරීමේ මණ්ඩලය

# තනතුරු පුරප්පාඩු

**පොල් වගාකිරීමේ මණ්ඩලය පහත සඳහන් තනතුරු පුරප්පාඩු සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

## තනතුර : නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූල්‍ය කළමනාකරණ)

**සුදුසුකම් හා පළපුරුද්ද**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ගණකාධිකරණ / ව්‍යාපාර පරිපාලනය / වාණිජවේදී උපාධියක් සමග ක්ෂේත්‍රයට අදාළ පශ්චාත් උපාධිය හෝ පිළිගත් වරලත් වෘත්තීය ගණකාධිකාරී ආයතනයක (ICA/CIMA/ACCA/ වෙනත්) ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම.

සමග

පිළිගත් ආයතනයක වසර 15 ක අදාළ ක්ෂේත්‍රයේ කළමනාකාර (Managerial) මට්ටමේ සේවා පළපුරුද්දක් ලබා තිබීම.

වැටුප් කාණ්ඩය : HM 1-1

වැටුප් පරිමාණය : රු. 80,295/- (2,270X15) 114,345/-

වයස : අවු. 35 ට නොඅඩු හා අවු. 55 ට නොවැඩි විය යුතුයි. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

බඳවා ගන්නා ආකාරය : ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මගින්

## තනතුර : නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ව්‍යාපෘති හා සංවර්ධන)

**සුදුසුකම් හා පළපුරුද්ද**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් කෘෂිකර්මය පිළිබඳ විශේෂ උපාධියක් සමග කෘෂිකර්ම විද්‍යාව / කෘෂිකර්ම ව්‍යාපෘතිය පිළිබඳ පශ්චාත් උපාධිධාරියෙකු වීම / කෘෂිකර්ම ක්ෂේත්‍රයේ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම.

සමග

පිළිගත් ආයතනයක වසර 15 ක අදාළ ක්ෂේත්‍රයේ කළමනාකාර (Managerial) මට්ටමේ සේවා පළපුරුද්දක් ලබා තිබීම.

වැටුප් කාණ්ඩය : HM 1-1

වැටුප් පරිමාණය : රු. 80,295/- (2,270X15) 114,345/-

වයස : අවු. 35 ට නොඅඩු හා අවු. 55 ට නොවැඩි විය යුතුයි. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

බඳවා ගන්නා ආකාරය : ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මගින්

## තනතුර : කළමනාකරු (තොරතුරු හා මාධ්‍ය)

**සුදුසුකම් හා පළපුරුද්ද**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ජන සංනිවේදන / විද්‍යාවේදී කෘෂිකර්ම උපාධිය හෝ ඒ හා සමාන වෙනත් උපාධියක්

සහ

උපාධිය ලබාගැනීමෙන් පසු අදාළ විෂය ක්ෂේත්‍රයේ වසර තුන (03) ක සේවා පළපුරුද්ද.

වැටුප් කාණ්ඩය : MM 1-1

වැටුප් පරිමාණය : රු. 53,175/- (1,375X10)(1,910X15) 95,575/-

වයස : අවු. 22 ට නොඅඩු හා අවු. 45 ට නොවැඩි විය යුතුයි. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

බඳවා ගන්නා ආකාරය : ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මගින්

## තනතුර : භාෂා පරිවර්තක (සිංහල - ඉංග්‍රීසි)

**සුදුසුකම් හා පළපුරුද්ද**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සිංහල හා / හෝ ඉංග්‍රීසි භාෂා විෂය සහිත උපාධියක් සමග රජයේ හෝ පිළිගත් ආයතනයක භාෂා පරිවර්තකයෙකු ලෙස (සිංහල - ඉංග්‍රීසි) වසරක පළපුරුද්ද.

වැටුප් කාණ්ඩය : MA 4

වැටුප් පරිමාණය : රු. 37,970/- (755X10)(930X15) (1,135X5) 65,145)/-

වයස : අවු. 22 ට නොඅඩු හා අවු. 45 ට නොවැඩි විය යුතුයි. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

බඳවා ගන්නා ආකාරය : ලිඛිත තරග විභාග හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මගින්

වෙනත් කොන්දේසි :

සෑම ඉල්ලුම්කරුවෙක් ම,

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

II. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

III. විශිෂ්ට චරිතයෙන් යුක්ත විය යුතුය.

අයදුම්පත් :

- ජීව දත්ත හා අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද පිළිබඳ විස්තර ඇතුළත් කර එම සුදුසුකම් සනාථ කළ හැකි සහතිකවල පිටපත් සමග අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. තවද දැනටමත් රජයේ / සංස්ථා / මණ්ඩලවල සේවයේ යෙදී සිටින අයදුම්කරුවන් තම අයදුම්පත් ආයතන ප්‍රධානීන් මගින් එවිය යුතුය.
- අයදුම්පත් බහා එවන ලිපි කවරයේ ඉහළ වම් කෙළවරේ අදාළ තනතුර සඳහන් කළ යුතුය. එසේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කර නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
- තනතුරු කිහිපයකට ඉල්ලුම් කරන්නේ නම් එක තනතුරකට එක බැගින් වනසේ අයදුම්පත්‍ර වෙන් වෙන්ව ඉදිරිපත් කළ යුතුවේ.
- සියලුම අයදුම්පත් 2021-05-21 දින හෝ එදිනට පෙර ලැබෙන සේ "සභාපති, පොල් වගාකිරීමේ මණ්ඩලය, 9/428, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධව අදාළ බඳවා ගැනීමේ බලධාරියා විසින් තීරණය කරනු ඇත. මෙම තනතුර සම්බන්ධයෙන් කරනු ලබන පෞද්ගලික විමසීම් ඒ සඳහා නුසුදුසුකමක් සේ සළකා කටයුතු කරනු ලැබේ.

**සභාපති,**
**පොල් වගාකිරීමේ මණ්ඩලය,**
**9/428, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,**
**බත්තරමුල්ල.**

Source: Dinamina, Daily News (2021.05.07)